# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1708/10 - 2011 මැයි 30 වැනි සඳුදා - 2011.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මහනුවර මහ නගර සභාව

252 වැනි අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු බව එකී ආඥාපනතේ 272 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මහ නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මහනුවර මහ නගර සභාව විසින් සාදනු ලැබූ සහ 2010.07.29 වැනි දින පැවති එකී මහ නගර සභාවේ අංක 8(53) දරන යෝජනාවෙන් සම්මත වී ඇති මෙහි පහත උපලේඛනයේ දැක්වෙන මහනුවර මහ නගර සභාවේ අපවිත්‍ර ජල කළමණාකරනය පද්ධතියට අදාළ වූ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී මහ නගර සභා ආඥාපනතේ 268 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාර මධ්‍ය පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍ය සරත් ඒකනායක වන ම'විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2011 අප්‍රේල් මස 26 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථා (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහනුවර මහ නගර සභාවේ අපවිත්‍ර ජල කළමනාකරණ පද්ධතියට අදාළ වූ අතුරු ව්‍යවස්ථා" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ අතුරු ව්‍යවස්ථා මහනුවර මහ නගර සභාවේ පරිපාලන සීමාවන් තුළ පිහිටියා වූ පළමුවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇත්තා වූ ප්‍රදේශ ඇතුළත පවත්නා ගොඩනැගිලිවලට සහ එම ප්‍රදේශය ඇතුළත සිදුකරනු ලැබිය හැකි වෙනත් යම් ඉදිකිරීම්වලට අදාළ විය යුතුය.

3. යම් ගොඩනැගිල්ලකින් හෝ එහි යම් කොටසකින් ආරම්භ වන මළාපවාහන සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ නල (මෙහි මින්මතු "පද්ධතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අප ජලය කළමනාකරණ පද්ධතියට සම්බන්ධ කරනු ලැබිය යුතු ය.


1A - PG 001250 —420 (2011/05)

**කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

4. (ii) දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකින් ආරම්භ වන දැනට පවත්නා මළාපවාහන සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ නළ පද්ධතිය අසතුටුදායක බවට තමා වෙත ඉදිරිපත් කරන ලද යම් පැමිණිල්ලකට හෝ නියෝජනයකට පසුව (මෙහි මින්මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නාගරික කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් තමා වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කොමසාරිස්වරයා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට හෝ කොමසාරිස්වරයා විසින් ලිඛිතව බලය පවරනු ලබන යම් නිලධරයෙකුට නියම කරනු ලැබිය යුතු ය.

(ii) එම වාර්තා පරීක්ෂා කිරීමෙන් පසුව සහ එම පද්ධතියට නළ මාර්ගයක් සම්බන්ධ කිරීමේ අවශ්‍යතාව පිළිබඳව සෑහීමට පත්වීමෙන් පසු කොමසාරිස්වරයා විසින් තාක්ෂණික අවශ්‍යතාවල ස්වභාවය සැළකිල්ලට ගෙන එම නළ මාර්ගය මාස හයක් ඇතුළත හෝ කොමසාරිස්වරයා තීරණය කරන වෙනත් යම් කාලයක් ඇතුළත පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් කටයුතු සළස්වනු ලැබිය යුතු ය.

5. (අ) මළාපවාහන සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ නළ මාර්ගය පද්ධතියට සම්බන්ධ කිරීම අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවල දෙවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකෘති පත්‍රයට අනුව වූ ඉල්ලීමක් එහි සඳහන් ගාස්තුව ද සමග කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එවැනි ඉල්ලීමක් ලැබුණ විට නළ මාර්ග පද්ධතියට යාකිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳව කොමසාරිස්වරයා විසින් සෑහීමට පත් වූ අවස්ථාවක ඇස්තමේන්තු ගත පිරිවැය සහ අවශ්‍යතාවයේ ශක්‍යතාවය පිළිබඳව ඇගයීමෙන් පසුව කොමසාරිස්වරයා විසින් එම ඉල්ලීම අනුමත කරනු ලැබිය යුතු ය.

(ඇ) මෙම අතුරු ව්‍යවස්ථාවල (ආ) ඡේදයේ කාර්ය සඳහා සැළැස්මේ යෝග්‍යතාවය සහ ප්‍රවේශය සැළකිල්ලට ගෙන කොමසාරිස්වරයා විසින් නළ එලිය යුතු ආකාරය තීරණය කරනු ලැබිය යුතු අතර තුන්වන (උපලේඛනයේ සඳහන් උපමාන ප්‍රකාරව ඇස්තමේන්තුගත පිරිවැය පිළියෙල කිරීමට කටයුතු සළස්වනු ලැබිය යුතු ය. තවද එම ඉල්ලීම ලැබී දින දහහතරක් ඇතුළත ඇස්තමේන්තු ගත පිරිවැය පිළිබඳ ඉල්ලුම්කරුට දැනුම් දිය යුතුය.

(ඈ) මළාපවාහනය සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ දී නළ මාර්ගය පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා වූ ඉල්ලීම අනුමත කරනු ලැබූ විට කොමාරිස්වරයා විසින් හෝ තත් කාර්ය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් නිලධරයෙකු විසින් අනුමත කරන ලද ප්‍රමිතියෙන් සහ තත්වයෙන් නළ සහ උපාංග අයිතිකරු හෝ නෛතික පදිංචිකරු විසින් භාවිත කරනු ලැබිය යුතු ය.

6. (අ) නළ මාර්ග එලීමේ සහ නඩත්තු කිරීමේ කටයුතුවල නියැලීමට අපේක්ෂා කරන සෑම සුදුසුකම් ලැබූ තැනැත්තකුට ලියාපදිංචිවීම සඳහා කලින් කල සභාව විසින් අනුමත කරනු ලබන තාක්ෂණික ඇගයීම කමිටුවක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තෝරා ගන්නා ලද සෑම තැනැත්තෙකුම -

(i) තුන්වැනි උපලේඛනයේ දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සභාව සමග ගිවිසුමකට එළඹිය යුතු ය.

(ii) තත් කාර්ය සඳහා වූ බලපත්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ හතරවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති බලපත්‍ර ගාස්තුව ගෙවීමෙන් ලබා ගත යුතු ය.

7. තත්කාර්ය සඳහා 6 වැනි අතුරු ව්‍යස්ථාව යටතේ බලපත්‍රයක් ලබා ගෙන ඇති තැනැත්තෙකුට හැර වෙනත් කිසිම තැනැත්තෙකුට මළාපවාහන සහ අප ජලය රැගෙන යන නළ මාර්ග පද්ධතියට සම්බන්ධ කර නළ එලීම සඳහා අවසර ලබා නොදිය යුතු ය.

8. මළාපවාහන සහ අපවිත්‍ර ජලය නිදහසේ ගලායාමට පහසුවන පරිදි සභාව විසින් සුදුසු ස්ථානවල පොම්පාගාර ඉදි කරනු ලැබිය හැකි ය.

9. මළාපවාහන සහ අපවිත්‍ර ජලය රැගෙන යන නළ මාර්ගය පෞද්ගලික ඉඩමක් හෝ දේපළක් හරහා එලීමට අවශ්‍ය වන අවස්ථාවක සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් අවම කිරීම සඳහා මහනගර සභා ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව පියවර ගනු ලැබිය යුතු අතර –

(අ) අවශ්‍ය අවස්ථාවන්හී දී පද්ධතිය සඳහා සභාව විසින් නළ එලීමේදී එම සභාව විසින් එසේ නළ එලීම යම් රීතියක් හෝ රීතියක් වශයෙන් සකස් කිරීමට සැළසුම් කර ඇති හෝ අදහස් කරනු ලබන යම් ස්ථානයක් හරහා හෝ එය යටින් නැතහොත් යම් ගොඩනැගිල්ලකින් යටින් හෝ යම් උමගක්, කාමරයක් හෝ ආරුක්කුවක් හෝ ආවරණය කරන ලද ඉඩමක් හෝ වෙනත් ඉඩමක් හරහා අවස්ථාවෝචිත පරිදි එම නළ එලීම සිදු කරනු ලැබිය හැකි ය. එම ක්‍රියාකාරකම්වලින් බලපෑමක් සිදුවන ඉඩමේ අයිතිකරුට හෝ නෛතික පදිංචිකරුට සභාව විසින් ඒ පිළිබඳව ලිත් මාස දෙකකට පෙර ඒ බව දැන්විය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් මළාපවාහන නළ එලීමේ යෙදී සිටිය දී අදාළ දේපලෙහි අයිතිකරුට හෝ නිත්‍යානුකූල පදිංචිකරුට සිදුවිය හැකියම් පාඩුවක් හෝ අලාභයක් සඳහා සභාව විසින් වන්දි මුදල් ගෙවිය යුතු ය.

(ඇ) යම් පාඩුවක් හෝ අලාභයක් සිදු වී ඇති අයිතිකරුවෙකු හෝ නිත්‍යානුකූල පදිංචිකරුවෙකු විසින් එම වැඩ සම්බන්ධයෙන් හිමිකම්පෑම පැන නැගුන දින සිට දින දහහතරක් ඇතුළත තත්කාර්ය සම්බන්ධයෙන් වූ ඉල්ලීමක් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ඈ) වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් ආරවුලක් පැන නැගී ඇති අවස්ථාවක දී අතෘප්තියටපත් පාර්ශ්වය විසින් ඒ සඳහා වන අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(ඉ) එවැනි අභියාචනයක් ලැබුණු දිනයේ සිට දින තිහක කාලයක් ඇතුළත කොමසාරිස්වරයා විසින් සභාවේ තීරණය අතෘප්තියට පත් පාර්ශ්වයට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ඊ) (ඈ) ඡේදයෙහි සඳහන් යම් අභියාචනයක් සම්බන්ධයෙන් වූ සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

10. (අ) යම් පරිශ්‍රයක මළාපවහන බැහැර කිරීම සඳහා එකම හෝ ප්‍රායෝගික වශයෙන් ඉතා සුදුසු ක්‍රමය එම මළාපවහන පරිශ්‍රයේ අයිතිකරු හැර වෙනත් තැනැත්තකුට අයත් යම් ඉඩමකට, එය හරහා හෝ එය යටින් බැහැර කිරීම බව නගර සභාවට පෙනී යන අවස්ථාවක, එකී ඉඩමට හෝ එය හරහා හෝ එය යටින් මළාපවහන රැගෙන නොයා යුත්තේ ඇයිද යන්න පිළිබඳ හේතු ඉදිරිපත් කිරීමට සාධාරණ අවස්ථාවක් ඉඩමේ අයිතිකරුට ලබාදීමෙන් පසු නැතහොත් කිසිදු විරෝධතාවක් මතුකර නොමැති වීම හෝ මතුකර ඇති යම් විරෝධතාවක් අසතුටුදායක බව සභාවට පෙනී යන විට සභාව විසින් සුදුසු යයි සළකනු ලබන ආකාරයට එම ඉඩමට හෝ එය හරහා හෝ එය යටින් ස්වකීය මළාපවහන රැගෙන යාමට එම පරිශ්‍රයේ අයිතිකරුට ලිඛිතව බලය පවරමින් සභාව විසින් නියමයක් කරනු ලැබිය හැකි ය.

(ආ) අවශ්‍ය වැඩ කටයුතු ඉටු කිරීම සඳහා උදෑසන 6.00 සිට සවස 6.00 දක්වා කවර හෝ අවස්ථාවක තම සහායකයන් සහ සේවකයන් සමග එකී ඉඩමට ඇතුළුවීමට ඇති අදහස පිළිබඳව එම ඉඩමේ අයිතිකරුට හෝ නීත්‍යානුකූල පදිංචිකරුට ලිඛිත සාධාරණ දැනුම්දීමක් ලබා දීමෙන් පසු එවැනි සෑම නියමයක්ම එම නියමය කරනු ලබන තැනැත්තාට හෝ ඔහු විසින් සේවයේ නියුක්ත කරනු ලබන යම් අනුයෝජිතයකුට හෝ තැනැත්තෙකුට ලබා දෙන වලංගු බලයක් විය යුතු ය.

(ඇ) මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව යම් පරිශ්‍රයක අයිතිකරුවෙකු හෝ නෛතික පදිංචිකරු විසින් නැතහොත් මළාපවහන බැහැර කිරීමේ කාර්ය සඳහා ඔහු විසින් සේවයේ නියුක්ත කරන ලද යම් නියෝජිතයෙකු හෝ තැනැත්තකු විසින් තම පරිශ්‍රයේ මළාපවහන සඳහා මළාපවහන නළ නිත්‍යානුකූලව ඉඳිකර ඇති ඉඩමකට එම මළාපවහන පද්ධතිය අළුත්වැඩියා කිරීමේ හෝ පිරිසිදු කිරීමේ කාර්ය සඳහා උදෑසන 6.00 සිට සවස 6.00 දක්වා කවර හෝ අවස්ථාවක තම සහායකයන් සහ සේවකයන් සමග එකී ඉඩමට ඇතුළුවීමට තමා තුළ ඇති අදහස පිළිබඳව සාධාරණ ලෙස දැනුම් දීමක් අදාළ ඉඩමේ අයිතිකරු වෙත ලබාදීමෙන් පසු එකී ඉඩමට ඇතුළු විය හැකි ය.

එසේ වුවද යම් හදිසි අවස්ථාවක දී එම මළාපවහන පද්ධතිය අළුත්වැඩියා කිරීමේ හෝ පිරිසිදු කිරීමේ කාර්ය සඳහා අදාළ ඉඩමේ අයිතිකරුට සහ ඒ පරිශ්‍රයේ අයිතිකරුවන්ට හා නිත්‍යානුකූල පදිංචිකරුට දැනුම්දීමෙන් පසු සවස 6.00 පසුව වුවද තත් කාර්ය සඳහා සභාව විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ සේවකයකු එකී ඉඩමට ඇතුළුවීම නිත්‍යානුකූල වන්නේ ය.

(ඈ) ඉහත කී අතුරු ව්‍යවස්ථා යටතේ යම් වැඩක් ඉටු කිරීමේ දී එම පරිශ්‍රයට සහ එම වැඩවලින් ප්‍රතිලාභ ලබන එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ නිත්‍යානුකූල පදිංචිකරුට සිදුවිය හැකි යම් පාඩුවක් හෝ අලාභයක් අවම කිරීමට නගර සභාව පියවර ගත යුතු අතර -

(i) සභාව විසින් අවම ප්‍රායෝගික ප්‍රමාදයක් සහිතව එම වැඩ ඉටු කිරීමට සැළැස්විය යුතු ය ;

(ii) එකී වැඩ ඉටු කිරීමේ කාර්ය සඳහා කණින ලද ඉඩම තම වියදමින් නැවත යථාතත්වයට පත් කළ යුතු ය ;

(iii) එකී වැඩ ඉටු කිරීම නිසා තම දේපළට අලාභ සිදු වූ යම් තැනැත්තකුට එකී ස්ථානය නැවතත් යථාතත්වයට පත්කිරීම සඳහා භාවිත කරනු ලබන භාණ්ඩ සඳහා සභාව විසින් අනුමත කරනු ලබන වෙළඳපල වටිනාකම සැළකිල්ලට ගෙන එම තැනැත්තාට සභාව විසින් වන්දි ගෙවන ලැබිය යුතු ය.

(ඉ) මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව සභාව වෙත සාධාරණ හේතු ඉදිරිපත් නොකර යම් වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් ඉඩමක අයිතිකරු හෝ නිත්‍යානුකූල පදිංචිකරු විසින් එම වැඩ ඉටු කිරීමට අවසරදීම ප්‍රතික්ෂේප කිරීම හෝ එම වැඩ ඉටුකිරීම වැළැක්වීම නොකළ යුතු ය. එවැනි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(ඊ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ යම් ඉඩමකට හෝ එය හරහා හෝ එය යටතේ මළාපවහන නළ රැගෙන ගොස් ඇති අවස්ථාවක සහ ඉන් පසුව එම ඉඩමෙහි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට එකී ඉඩමේ අයිතිකරු හෝ නිත්‍යානුකූල පදිංචිකරු අදහස් කරන අවස්ථාවක එකී මළාපවහන නළ ඉදි කරනු ලැබුවේ යම් තැනැත්තෙකුගේ ප්‍රතිලාභය සඳහා ද එකී අයිතිකරුට හෝ නෛතික පදිංචිකරුට සභාව විසින් ලිඛිත දැන්වීමක් යවමින් සභාව විසින් අනුමත කරනු ලබන ආකාරයට එකී මළාපවහන නළ වසා දැමීමට, ඉවත් කිරීමට, වෙනත් අතකට යොමු කිරීමට, නැවත ඉදි කිරීමට හෝ ආරක්ෂා කිරීමට සහ ඉඩම යථා තත්වයට පත් කිරීමට කටයුතු කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය ;

(උ) සභාව විසින් දැනුම් දෙනු ලබන පරිදි සෑම අයිතිකරුවකු හෝ නෛතික පදිංචිකරුවකු විසින් 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ඊ) ඡේදය යටතේ තමා වෙත භාරදෙන ලද යම් දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් මහනගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තිය අදාළ විය යුතු ය.

11. මළාපවහන නළ පරීක්ෂා කිරීමේ, අළුත්වැඩිය කිරීමේ, පිරිසිදු කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්ය සඳහා උදෑසන 6.00 සිට සවස 6.00 දක්වා වූ කවර අවස්ථාවක යම් පෞද්ගලික ඉඩමකට හෝ දේපළකට ඇතුළුවීමට පෙර එහි අයිතිකරු හෝ පදිංචිකරු වෙත ලිඛිතව දැන්වීමක් ලබා දීමෙන් පසු සභාව විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද නිලධරයකු හෝ සේවකයකු එකී ඉඩම හෝ දේපළට ඇතුළුවීම නිත්‍යානුකූල වන්නේ ය.

12. මළාපවහන නළ පද්ධතිය අළුත්වැඩියා කිරීමට අදාළව පස් කැණීම සහ ඉවත් කිරීම වැනි සභාවේ නඩත්තු වැඩවල නියැලී සිටින විට සභාව විසින් බලය පවරන ලද යම් නිලධරයෙකුට හෝ සේවකයෙකුට කිසිම තැනැත්තෙකු විසින් අවහිර නොකළ යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කිරීම සම්බන්ධයෙන් මහනගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

13. කිසිම තැනැත්තෙකු විසින් නළවලට, පොම්පාගාරවලට, ටැංකිවලට, මනුවලට හෝ මළාපවහන පද්ධතියේ යම් සංරචකයකට හෝ කොටසකට කවර හෝ අලාභයක් සිදු නොකළ යුතු ය.

14. 13 වැනි අතුරු ව්‍යවස්ථාව කඩ කරන සෑම තැනැත්තෙක්ම මළාපවහන පද්ධතියේ මළ පොම්පාගාර, ටැංකි, අභ්‍යන්තර මනු බිල (මැන්හෝල්) හෝ වෙනත් සංරචකයක් හෝ කොටසක් අළුත්වැඩියා කිරීමේදී නගර සභාව විසින් දරනු ලබන සියලු වියදම් 13 වැනි අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කරන සෑම තැනැත්තෙකු විසින් ම ගෙවිය යුතු අතර ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක එම වියදම් යථා පරිදි ගෙවන තෙක් එම තැනැත්තාට ලබා දී ඇති ජල සැපයුම තාවකාලිකව විසන්ධි කිරීමට කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතු ය.

15. (1) පද්ධතියට සම්බන්ධවීම හරහා මළාපවහන බැහැර කිරීමේ සේවය ලබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම මාසික ජල පරිභෝජනයට අනුකූලව ගණන් බලනු ලබන යම් මුදලක් හෝ සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ගණන් බලනු ලබන මුදලක් අයකරනු ලැබිය යුතු අතර එසේ අයකරනු ලබන හෝ පනවනු ලබන මුදල මාසික ජල පරිභෝජන බිල්පතේ සඳහන් කළ යුතු ය. දින තිහක කාලයක් ඇතුළත එකී මුදල ගෙවන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය. එකී මුදල ගෙවීම පැහැර හැරීමේ දී හෝ ප්‍රමාද කිරීමේදී කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන අධිකාර පත්‍රයට අදාළව බිල්පත්‍රයේ සඳහන් මුදල 10% ක අධිභාරයකට යටත් කළ යුතු අතර එකී සම්පූර්ණ මුදල දින හතලිස්පහක් ඇතුළත ගෙවීම පැහැර හරිනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් අදාළ පරිශ්‍රයට සපයා ඇති ජල සැපයුම විසන්ධි කළ යුතු ය ;

(2) මළාපවහන බැහැර කිරීමේ කාර්ය සඳහා පමණක් පද්ධතියට සම්බන්ධවීමට අදහස් කරන සහ සභාවෙන් ජල සැපයුමක් ලබා නොමැති යම් තැනැත්තෙක් පස්වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ආකාරයට කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන ගාස්තුවක් සමග සභාව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. එම ස්ථානයේ සාමාන්‍ය මාසික ජල පරිභෝජනයට අනුකූලව ගණන් බලනු ලබන මුදලක් ඔහුගෙන් අයකරනු ලැබිය යුතු ය.

16. කිසිම තැනැත්තෙකු විසින් -

(i) පද්ධතියේ නළ මාර්ගවලට නොදැමිය යුතු බවට අදහස් කරනු ලබන යම් ඝන අපද්‍රව්‍යක්, කෘමි නාශකයක්, වර්ෂා ජලය අපවිත්‍ර වූ වර්ෂා ජලය සහ අපවිත්‍ර වූ දුව, රසායනික ද්‍රව්‍ය,

(ii) උණුදිය, හුමාලය, මළාපවාහන නිදහසේ ගමන් කිරීමට බාධා වන යම් දෙයක් සහ මළාපවාහන සඳහා යොදන සහ එය බැහැර කිරීම සඳහා වූ යම් ද්‍රව්‍යයක් හෝ අවහිරයක් විය හැකි යම් දෙයක්,

(iii) මෙම නළ පද්ධතිය තුළට නොදැමිය යුතු බවට අදහස් කරන හෝ එසේ දැමීම මගින් වෙනත් යම් නළ පද්ධතියකට අවහිර වන හෝ අන්‍යාකාරයකට බාධාවක් සිදු වන පස්, ගඩොල් හෝ ගල් අළු හෝ වෙනත් දෙයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ පද්ධතියේ යම් සංරචකයකට හෝ කොටසකට බාධා සිදු වන යම් දෙයක් මෙම පද්ධතිය තුළට බැහැර කිරීම, දැමීම, ඇතුල් කිරීම, එය හරහා යැවීම හා කිරීම තැබීම එසේ බැහැර කිරීමට, දැමීමට ඇතුල්කිරීමට, විසි කිරීමට, හරහා යැවීමට, හෝ පා කිරීම හෝ තැබීමට ඉඩ සැළැස්වීම නොකළ යුතු ය.

17. නගර සභාවේ ලිඛිත අවසරය ඇතිව මිස, කිසිම තැනැත්තෙකු විසින් යම් කාණුවක් පිටවන නළයක් ඇතුළු යම් වැසිකිලියක් හෝ ඊට සම්බන්ධ යම් උපකරණයක් හෝ සවි කිරීමක් වෙනස් කිරීම බැහැර කිරීම හෝ සවි කිර ඇති ස්ථානය වෙනස් කිරීම හෝ ඊට බාධා කිරීම, ගැලවීම, වැසීම, වෙනස් කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම නොකළ යුතු ය.

18. කිසිම තැනැත්තකු විසින් මෙම අතුරු ව්‍යවස්ථා කඩ කරමින් යම් ගොඩනැගිල්ලක හෝ පරිශ්‍රය තුළ ඇති වෙනත් ව්‍යුහයක ආධාරයක් සඳහා ලබා දී ඇති යම් මළාපවහන පද්ධතියක් වැසිකිලියක් හෝ වෙනත් උපකරණයක් බාධා සිදුවන පරිදි යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, නැවත ඉදිකිරීම හෝ වෙනස් කිරීම නොකළ යුතු ය.

19. කිසිම තැනැත්තකු විසින් නගර සභාවේ ලිඛිතව අවසරය හෝ තත් කාර්ය සඳහා බලය පවරන ලද නිළධරයකුගේ ලිඛිත අවසරය ඇතිව මිස -

(i) පද්ධතියේ යම් නළයකට වෙනත් නළයක් සම්බන්ධ කිරීම හෝ සම්බන්ධ කිරීමට සැළැස්වීම නොකළ යුතු ය ;

(ii) පද්ධතියේ අභ්‍යන්තර නළ අළුත්වැඩියා කිරීම හෝ එසේ කිරීමට සැළැස්වීම නොකළ යුතු ය; හෝ

(iii) පද්ධතියෙන් හෝ නළ පොම්පාගාර ටැංකි මනු බිල් පොම්පාගාර හෝ වෙනත් සංරචකයකින් හෝ කොටසකින් යම් දෙයක් ගැලවීම නොකල යුතු ය.

20. කිසිම තැනැත්තකු විසින් 16,17,18 සහ 19 යන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය නොකළ යුතු අතර එවැනි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් මහනගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

21. (i) මහනගර සභාවේ හෝ නගර සභාව විසින් බලය පවරන ලද නිලධාරයෙකුගේ ලිඛිත අවසරය කලින් ලබා නොගෙන කිසිම තැනැත්තෙකු විසින් පද්ධතිය මත යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් ව්‍යුහයක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට සැළැස්වීම නොකළ යුතු ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මහනගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය ;

(ii) නගර සභාවේ අනුමැතියක් නොමැතිව සිදු කරන ලද හෝ තනන ලද (1) වැනි ඡේදයේ සඳහන් යම් ගොඩනැගිල්ල්ක් හෝ ව්‍යුහයක් කඩා දැමීමට, වෙනස් කිරීමට මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල වන පරිදි සකස් කිරීමට සභාව කටයුතු යොදනු ලැබිය යුතු අතර එමගින් සිදු වූ වියදම් බවට කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන මුදලක් නගර සභාවේ අනුමැතිය නොමැතිව එකී ගොඩනැගිල්ල හෝ ව්‍යුහය ඉදිකල හෝ තනන ලද තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය. එසේ ගෙවීම පැහැර හරින අවස්ථාවකදී එය මහනගර සභා ආඥාපනතේ 275 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ලෙස සළකා එය අය කරගනු ලැබිය යුතු ය.

22. 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පද්ධතියට බාධා කරන යම් තැනැත්තෙක් පද්ධතියේ නළවලට සිදු වූ යම් බාධාවක් ඉවත් කිරීමේදී නගර සභාව විසින් දරන ලද වියදම් ගෙවිය යුතු බවට එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය. එසේ ගෙවීම පැහැර හරින අවස්ථාවක දී එම මුදල මහනගර සභා ආඥාපනතේ 275 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අය කර ගනු ලැබිය යුතු ය.

23. (1) (i) යම් පෞද්ගලික ජලපවාහන පද්ධතියක් හෝ මළාපවහන උපකරණ ඉදි කිරීම සවි කිරීම හෝ වෙනස් කිරීම ; හෝ

(ii) පද්ධතිය සමග යම් පෞද්ගලික මළාපවහන සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ නළ මාර්ග පද්ධතියක් සම්බන්ධ කිරීම.

සම්බන්ධයෙන් වූ සියලු වැඩ මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව මළාපවහන සේවා සපයා ඇති අවස්ථාවක සභාව විසින් අනුමත කරන ලද පරිශ්‍රයේ අයිතිකරු හෝ නිත්‍යානුකූල පදිංචිකරුගේ වියදමින් සභාවේ බලය පවරන ලද නිලධරයෙකු විසින් පමණක් හෝ නගර සභාව වෙත ලියා පදිංචි වී ඇති තැනැත්තෙකු විසින් ඉටු කළ යුතු ය ;

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ඉටු කරනු ලබන වැඩ නගර සභාව විසින් තත් කාර්ය සඳහා බලය පවරන ලද නිලධරයෙක් විසින් දවසේ ඕනෑම සුදුසු වේලාවක් තුළ පරීක්ෂා කිරීමට යටත් විය යුතු ය ;

24. (1) මළාපවහන සහ අපවිත්‍ර ජල නළ මාර්ග ස්ථාපනය කිරීම මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සිදු කර ඇති බවට කොමසාරිස්වරයාගේ අනුමැතිය ලැබී ඇත්නම් මිස මළාපවහන සහ අපවිත්‍ර ජල නළ පද්ධතියක් භාවිත කිරීම නොකළ යුතු ය ;

(2) (1) වැනි ඡේදයේ සඳහන් යම් ස්ථාපනයට කිරීමක් එම නළ මාර්ග පරීක්ෂා කිරීම සඳහා බලය පවරා ඇති නිළධරයාගේ නිර්දේශය මත කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"සභාව" යන්නෙන් මහනුවර මහනගර සභාව අදහස් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් මහනුවර මහනගර සභාවේ නාගරික කොමසාරිස්වරයා අදහස් වන අතර මෙම අතුරු ව්‍යවස්ථාවල කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් යම් නිලධරයෙක්ද ඇතුළත් වේ.

"වෛද්‍ය නිළධරයා" යන්නෙන් මහනුවර මහනගර සභාවේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියා අදහස් වේ.

"නළය" යන්නෙන් මළාපවාහන සහ අපවිත්‍ර ජල නළ අදහස් වේ.

"අපවිත්‍ර ජලය කළමනාකරණ පද්ධතිය" යන්නෙන් මළාපවහන සහ අපවිත්‍ර ජලය පිරිසිදු කිරීමේ පිරියත දක්වා රැගෙන යන නළ පද්ධතිය අදහස් වේ.

"අප ජලය" යන්නෙන් වැසිකිළි, කැසිකිලි, නාන කාමර, මුල්තැන්ගෙය යන ස්ථානවලින් පමණක් බැහැර කරන ජලය පමණක් අදහස් වන අතර යම් කාර්මික අප ද්‍රව්‍යයක් ඊට ඇතුළත් නොවේ.

***පළමු වන උපලේඛනය***

මහනුවර මහනගර සභාවේ පරිපාලන සීමාවන්, 1967 ඔක්තෝබර් මස 7 වැනි දින අංක 14769/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නිශ්චිතව සඳහන් පරිදි වේ.

***දෙවන උපලේඛනය***

මළාපවහන සම්බන්ධතාව සඳහා වූ ඉල්ලුම් පත්‍රය.

මහනුවර ............................ පාරේ/වීදියේ/පටුමගේ වරිපනම් අංක ............................................... දරන පරිශ්‍රයේ අයිතිකරු / නිත්‍යානුකූල පදිංචිකරු වන ............................................... පූජක/මහතා/මහත්මිය/මෙනවිය වන මම මේ සමග ඉදිරිපත් කර ඇති සැළසුම් සහ පිරිවිතරවලට අනුකූලව සහ මහනගර සභා ආඥාපනතේ සහ අදාළ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව හා ඔබගේ අනුමතිය මත මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් පරිශ්‍රයේ මළාපවහන සහ අප ජල නළ මාර්ගවල සිට අප ජලය කළමනාකරණ පද්ධතියට සම්බන්ධතාවක් ඉදිකිරීම සඳහා මෙයින් ඉල්ලුම් කරමි.

අනුමත සැළැස්මට අනුකූල නොවන හෝ ආඥා පනතේ සහ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය කරන යම් ඉදිකිරීමක් සම්බන්ධයෙන් මාවිසින් වගකීම භාර ගන්නා බවට තව දුරටත් මම එකඟ වෙමි.

....................................................

ඉල්ලුම්කරුගේ නම :

ඉල්ලුම්කරුගේ අත්සන :

දිනය :

(2) ඉල්ලුම්පත්‍ර ගාස්තුව රුපියල් 200/- කි.

*තුන් වන උපලේඛනය*

(1) ප්‍රධාන නළ මාර්ගයේ සිට අතර මග ඇති අභ්‍යන්තර මනු බිල දක්වා සම්බන්ධතාවය (එම් එච් ටී සිට සී 1)

| *අයිතම අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* | *ඒකක* | *අනුප්‍රමාණය* | *මුදල* |
|---|---|---|---|---|---|
| | පොළව කැණීම ප්‍රධාන නළ මාර්ගයේ සිට අතර මග අභ්‍යන්තර මනු බිල දක්වා පිපිරවීම අවශ්‍යවන කළුගල් හැර යම් ද්‍රව්‍යයක මි.මී. 450 ක් පුළුල් අගල් කැණීම පිරවීම බෝර ගැසීම අතිරික්ත ද්‍රව්‍ය පැතිරවීම සහ මට්ටම් කිරීම යම් අතිරික්ත ද්‍රව්‍යයක් බැහැර කිරීම සඳහා වූ අනුප්‍රමාණ විධාන කරනු ලබන පරිදි විය යුතු ය. | | | | |
| 1 | උපරිම ගැඹුර මී 2.0 නොඉක්මවිය යුතු ය. | | M3 | | |
| 2 | වැලි තට්ටුව<br>අවම වශයෙන් පළලින් මි.මි. 450 කට සහ ගැඹුරින් මි.මි.100 ක අගල දිගේ වැලි ඇතිරවීම | | M3 | | |
| 3 | නළ එලීම<br>මි.මි. 160 ක අර්ධ විෂ්කම්භයක් ඇති 600 UPVC එලීම නළ සැපයීම | | M3 | | |
| 4 | එලීම සහ සම්බන්ධ කිරීම<br>විෂ්කම්භය මි.මී. 100 ක්වූ 600 UPVC නළ සැපයීම, එලීම සහ සවි කිරීම අතරමග අභ්‍යන්තර මනු බිල එකක් ඉදිකිරීම රූපසටහන්වල | | M3 | | |
| 5 | පෙන්නුම්කර ඇති පරිදි අතරමග අභ්‍යන්තර මනු බිල එකක් (අයි සී D 1) ඉදි කිරීම මි.මි. 100 ක් ඝනකම ඇති පදනම 1:2 2:4 - (19) කොන්ක්‍රීට් මිශ්‍රණයකින් විය යුතු අතර මි.මි. 225 ක් ඝනකම ඇති බිත්ති ගඩොල්වලින් සෑදිය යුතුය. අභ්‍යන්තර බිත්තිවල මතුපිට මි.මි. 20 ඝනකම ඇති සිමෙන්ති බදාම 1:3 මිශ්‍රණයකින් කපරාරු කළ යුතු ය. ඩී 1 දරන අභ්‍යන්තර මනු බිලකින් ආවරණය රූප සටහනේ පෙන්වා ඇති ආකාරයට සවි කළ යුතු ය. එම් එස් පියගැටපෙළ රූප සටහනට අනුව සාදා සවි කළ යුතු ය. කැණීම් පිරවීම ආකෘති වැඩ සිමෙන්ති බැම්ම මුක්කු සෑදීම ජලය ඉවත් කිරීම සහ මැටියෙන් සාදන ලද ඉන්ටර් සෙන්ටර් සවි කිරීම සහ ඩී 1 දරන අභ්‍යන්තර මනු බිල ආවරණය යන කරුණු සඳහා අනුප්‍රමාණවල ඇතුළත් විය යුතු ය. ප්‍රමාණයෙන් මි.මි. 600X600X1500 (අභ්‍යන්තර දිග පළල උස) යුක්ත වූ ඉන්ටර් සෙප්ටර් අභ්‍යන්තර මනු බිල | | | | |
| | දෙපාර්තමේන්තු ගාස්තු 20% එකතු කරන්න. | | | | |
| | වෙනත් වියදම් | | | | .................. |
| | මුළු එකතුව | | | | |

**මහනුවර මහනගර සභාව**

මළාපවහන සම්බන්ධතාවක් ලබා ගැනීම සඳහා වූ ගිවිසුම

එක් පාර්ශ්වයකට (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන .................................. යන අයද (එකී ඉල්ලුම්කරු යන වචනය හෝ යෙදුම මෙහි භාවිත කර ඇති පරිදි එකී වචනයට පද සම්බන්ධයෙන් අවශ්‍යවන අවස්ථාවලදී ඉහත කී ඉල්ලුම්කරු ද ඔහුගේ / ඇගේ පොල්මංකරුවන්ද අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන්ද ඇතුළත් වේ) සහ අනික් පාර්ශ්වයට (මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන ) මහනුවර මහනගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ද (එකී වචන

හෝ යෙදුම මෙහි භාවිත කරන පරිදි එම වචනවලට හෝ යෙදුමට පද සම්බන්ධයෙන් අවශ්‍ය වන කල එකී කොමසාරිස්වරයා හෝ ඔහුගේ අනුප්‍රාප්තික සහ පැවරුම්ලාභීන් ද ඇතුළත් වේ.) යන තැනැත්තන් අතර .......................... (ගෘහස්ත/ගෘහස්ත හැර වෙනත් / පුන්‍යායතන) යන වර්ග වශයෙන් මළාපවහන සහ අපවිත්‍ර ජලය එකතු කිරීම සඳහා මෙම ගිවිසුම මහනුවර දී සාදා එයට ඇතුළත් වන ලදී.

.......................................... දරන ස්ථානය ඇතුළත තම පරිශ්‍රයේ දී මළාපවහන පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා ඉල්ලුම්කරු වගකිව යුතු වන හෙයින්ද, (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර මහනගර සභාවේ, අපවිත්‍ර ජල කළමනාකරණ පද්ධතියෙන් ඉල්ලුම්කරුගේ පරිශ්‍රයට මළාපවහන සම්බන්ධතාවක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරු විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති හෙයින්ද මෙහි දක්වා ඇති සහ අන්තර්ගත වන නියම සහ කොන්දේසි මත ඉහත කී පහසුකම ලබා දීමට මහනගර සභාව එකඟ වී ඇති බැවින්ද,

මෙහි පාර්ශ්වයන් අතර පහත දැක්වෙන පරිදි දැන් එකඟ වී ඇතඃ

1. ඉල්ලුම්කරු විසින් සභාව වෙත සත්‍ය සහ නිවැරදි තොරතුරු ලබා දිය යුතු අතර මළාපවහන සම්බන්ධතාව ලබා දීමේ කාර්ය සඳහා ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතු බවට සභාව විසින් නියම කරනු ලබන ගාස්තු ගෙවීමට ඉල්ලුම්කරු එකඟ වේ.

2. මළාපවහන සඳහා බද්දක් පනවනු ලබන අවස්ථාවක නගර සභාවේ මළාපවහන පද්ධතියෙන් මළාපවහන බැහැර කිරීම සඳහා සභාව විසින් කලින් කල පනවනු ලබන මාසික මළාපවහන ගාස්තු ගෙවීමට ඉල්ලුම්කරුට නියම කරනු ලැබේ. මළාපවහන ගාස්තු එක් මාසයක් ඇතුළත ගෙවනු නොලබන අවස්ථාවකදී සභාව විසින් සපයා ඇති ජල සැපයුම හෝ මළාපවහන සේවාව විසන්ධි කිරීමේ අයිතිය නගර සභාව තබා ගනී.

3. ඉල්ලුම්කරු විසින් තම පරිශ්‍රය ඇතුළත අභ්‍යන්තර මළාපවහන පද්ධතිය ක්‍රියාත්මක කළ යුතු ය.

4. (1) සභාව විසින් පනවනු ලබන සහ කලින් කල සංශෝධනය කරනු ලබන රීති සහ නියෝගවලට අනුකූලව ඉල්ලුම්කරු ක්‍රියා කළ යුතු අතර ඉල්ලුම්කරු විසින් :–

(අ) ඉල්ලුම්කරුගේ මළාපවහන පද්ධතියට සම්බන්ධ වී ඇති පොදු මාර්ගවල ඇති ප්‍රධාන මලාපවහන නළවලට ඇතුළුවීමට පරීක්ෂා කිරීමට අළුත්වැඩියා කිරීමට හෝ පිරිසිදු කිරීමට සභාවේ බලයලත් නිලධරයෙකුට හැර වෙනත් යම් තැනැත්තෙකුට ඉඩ නොදිය යුතු ය ;

(ආ) ඉහත කී පරිශ්‍රය ඇතුළත පොදු මළාපවහන නළවලට ඉහලින් කිසිදු ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදි නොකළ යුතු ය ;

(ඇ) නාගරික කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා නොගෙන යම් පෞද්ගලික මළාපවහන පද්ධතියක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් පොදු මළාපවහන පද්ධතිය සමග සම්බන්ධවීම හෝ සම්බන්ධවීමට සැළැස්වීම නොකළ යුතු ය ;

(ඈ) පොදු මාර්ගවල ඇති ප්‍රධාන මළාපවහන පද්ධතියේ යම් නළ මාර්ගයක් හෝ උපාංගයක් නැති වූ විට හෝ ඊට අලාභ සිදු වූ විට සභාව වෙත දැනුම් දිය යුතු ය ;

(ඉ) මළාපවහන පද්ධතිය ඉදිකරන අතරතුර හෝ ඉන්පසු කවර හෝ අවස්ථාවකදී තම පරිශ්‍රය තුළ ඇති ජල නළ සහ සවි කිරීම් ඇතුළු සියලු මළාපවහන ඉදිකිරීම් වෙත ලඟ වී ඒවා පරීක්ෂා කිරීමට නගර සභාවේ බලයලත් නිලධරයකුට හෝ සේවා නියුක්තයෙකුට අවසර දිය යුතු ය ;

(ඊ) සභාවේ අනුමත සැළැස්මට පටහැනිව මළාපවහන පද්ධතියට කිසිදු දීර්ඝ කිරීමක් ඉදි නොකළ යුතු ය ;

(උ) ඍජු මළාපවහන වැසිකිලිවල අපවිත්‍ර ජලය සහ මුළුතැන්ගේ අපවිත්‍ර ජලය පමණක් බැහැර කළ යුතු ය ;

(ඌ) මාසික බිලපත්‍රයේ නිශ්චිතව දැක්වෙන කාල සීමාව ඇතුළත මළාපවහන බැහැර කිරීමේ සේවාවට සම්බන්ධ නගර සභාවට අය විය යුතු සම්පූර්ණ ගාස්තු ගෙවිය යුතු ය ;

(එ) සැපයුම හෝ මළාපවහන බැහැර කිරීමේ සේවාව සම්බන්ධයෙන් වූ ගිවිසුමෙහි සහ එහි කලින් කල සංශෝධනවල නිශ්චිතව දැක්වෙන නියම සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කල යුතු අතර ඉල්ලුම්කරු විසින් යම් නියමයක් හෝ කොන්දේසියකට අනුකූල නොවී කටයුතු කිරීමේදී සපයන ලද මළාපවහන සහ අපවිත්‍ර ජල සේවාව තාවකාලිකව විසන්ධි කිරීම සඳහා යටත් වන්නේ ය.

5. (අ) කලින් කල සංශෝධිත පරිදි අපවිත්‍ර ජලය කළමනාකරණ පද්ධතියට අදාළ අතුරු ව්‍යවස්ථා සහ ගිවිසුමේ දැක්වෙන නියම හෝ කොන්දේසි ඉල්ලුම්කරු විසින් උල්ලංඝනය කරනු ලැබුවහොත් මළාපවහන සම්බන්ධතාව විසන්ධි කර සම්බන්ධතාවය ඉවත් කිරීම සඳහා ;

(ආ) හානියට පත් හෝ නැති වූ මළාපවහන නල සහ සවිකිරීමේ හෝ නිවාස මළාපවහන පද්ධතිය සහ ප්‍රධාන පාරවල ඇති ප්‍රධාන නළය සම්බන්ධ කරන වෙනත් උපාංග අළුත්වැඩියා කිරීම පිරිසිදු කිරීම හෝ ප්‍රතියෝජනය කිරීම සහ අළුත්වැඩියා කිරීමේ පිරිසිදු කිරීමේ සහ එම සවි කිරීම් ප්‍රතියෝජන කිරීමේ වියදම ඉල්ලුම්කරුගෙන් ආපසු අයකර ගත යුතු ය.

(ඇ) ඉල්ලුම්කරුට මළාපවහන සේවා ලබාදීම සඳහා වූ බදු සහ ගාස්තු අයකර ගැනීම සඳහා සහ අයිතිකරු/නිත්‍යානුකූල පදිංචිකරු විසින් මුදල් ගෙවීම පැහැර හැරීමේදී නගර සභාව විසින් ලබා දී ඇති ජල සැපයුම හෝ මළාපවහන සේවා සැපයුම විසන්ධි කිරීම සඳහා මහනුවර මහනගර සභාව විසින් ස්වකීය අයිතිය තබා ගනී.

ඉහත කී කරුණුවලට සාක්ෂි වශයෙන් මෙම ගිවිසුමට අදාළ පාර්ශවයන් විසින් ................................ දින මෙම ගිවිසුමට සිය අත්සන සහ මුද්‍රාව තබන ලදී.

................................................................................................................................................................................

................................................................................................................................................................................

සභාව සඳහා සහ එය වෙනුවෙන්,

අධ්‍යක්ෂ,

අපවිත්‍ර ජලය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය.

සාක්ෂිකරුවන් :

1. අත්සන :................................................................................ 2. අත්සන :......................................................................

ලිපිනය :................................................................................ ලිපිනය :......................................................................

................................................................................

................................................................................

................................................................................

අත්සන් කළේ :

................................................................................................................................................................................

................................ සහ ................................................................................................................................................

තත්වය :......................................................................................................

................................................................................................................................................................................

................................................................................................................................................................................

1. ....................................................................................................

....................................................................................................

තත්වය : අත්සන :

..........................................................................................................................................

..........................................................................................................................................

ඉල්ලුම්කරු සඳහා සහ ඔහු වෙනුවෙන් :

සාක්ෂිකරු :

1. අත්සන :................................................................................ 2. අත්සන :......................................................................

................................................................................................................................................................................

ලිපිනය :................................................................................ ලිපිනය :......................................................................

................................................................................................................................................................................

හතරවැනි උපලේඛනය

බලපත්‍ර ගාස්තුව රු.1000.00

06 - 225/1

**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උපවගන්තියේ 'ඌ' ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා '(ආනුෂංගික විධිවිධාන)' පනතේ '2 වැනි වගන්තිය' (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2011 අප්‍රේල් මස 26 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

01. මෙම අතුරු ව්‍යවස්ථා පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව විසින් අනුමතකර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකි ය.

03. පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 02 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල දෙවැනි උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත් සභාවට මාසිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුලී රථවාහන නවතා තැබීම කළයුතු අතර, එම කුලී රථවාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේ ය.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පලවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් වෙනුවෙන් ද ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

06. බලපත්‍රය ලබාගැනීම සඳහා තුන්වැනි උපලේඛනයේ ප්‍රකාර පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම් කළ යුතු ය.

07. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බල පත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

08. සෑම මසක ම පළමුවැනි දිනට පෙර අදාළ මාසය සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

09. පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුලී රථ වාහන නවතා තැබීමේ නැවතුම් පොළකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14 කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථ වාහන නැවතුම්පොළකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතු ය. එසේ දැන්වීමක් නොකළහොත් අදාළ මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලීරථ වාහන, නැවතුම්පොළ තුළ දී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයෙකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුලීරථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හෝ හැසිරීම හෝ හිරිහැරයක් වන සේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ / හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නිත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පූජාපිටිය ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"රථ වාහන පාලක" යන්නෙන් පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිලධාරියෙකු ද අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන්රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කෙරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

***උපලේඛන 01***

*පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීමට අනුමත ස්ථාන :*

| | | |
|---|---|---|
| * පූජාපිටිය උඩහහන්දිය | ව.අඩි. 450 | අලවතුගොඩ පාරේ බෝක්කුව ලඟ තිලක් බේක් හවුස් (ග්‍රොසරිය ළඟ සිට ජී. සරත් කුමාරගේ පළතුරු කඩය දක්වා |
| * පූජාපිටිය සමුපකාරය අසල | ව.අඩි. 300 | පූජාපිටිය සමුපකාරය ඉදිරිපිට එම්.සී. ෆාරූන්ගේ බොක්කාවල පිහිටි ඒ.එම්. (ස්ටෝර්ස්) දක්වා |
| * පූජාපිටිය බෝදිමළුව අසල | ව.අඩි. 400 | පූජාපිටිය මැදවල පාරේ ආරම්භයේ සිට මැදවල දෙසට මීටර් 20 |
| * පූජාපිටිය ප්‍රාදේශීය සභාව අසල | ව.අඩි. 360 | පූජාපිටිය ප්‍රාදේශීය සභාව කාර්යාලය අසල බටගල්ල පාර බන්දුල ලියනගේ තේ කඩය අසල සිට බටගල්ල පාර දෙසට බටගල්ල පූජාපිටිය මාර්ගය දක්වා |
| * බටගල්ල හන්දිය | ව.අඩි. 180 | බටගල්ල හන්දියේ සිට පූජාපිටිය දෙසට මීටර් 15 දක්වා මාර්ගය දෙපස |
| * වෑකඩ හදිරම හන්දිය | ව.අඩි. 240 | කිරලගම මාර්ගයේ මුලසිට වැලිකැටිය දෙසට මීටර 20 දක්වා මාර්ගය දෙපස |
| * නෙදර්පල් ළඟ | ව.අඩි. 250 | කසාවත්ත අතුරු මාර්ගය හන්දියේ සිට පූජාපිටිය දෙසට මීටර 15 දක්වා |

| | | |
|---|---|---|
| * 01 බුළුගොහොතැන්න හන්දිය (ට්‍රාන්ස්පෝමරය) | ව.අඩි. 250 | ට්‍රාන්ස්පෝමරය අසල සිට වැලිකැටිය දෙසට මීටර 20 |
| * අත්තරගම පාර හන්දිය | ව.අඩි. 450 | අත්තරගම පාර හන්දියේ සිට අඹතැන්න දෙසට මීටර 20ක් දක්වා |
| * වෙලේකඩේ බුදු මැදුර අසල | ව.අඩි. 250 | වෙලේකඩේ බුදු මැදුර ඉදිරිපිට අඹතැන්න දෙසට මීටර 20 ක් දක්වා මාර්ගය |
| * වෙලේකඩේ කළුවාන හන්දිය | ව.අඩි. 250 | මුල්ලේගම හාඩ්වෙයාර් ඉදිරිපිට මාර්ග (බෝක්කුව අසල කඩය) අඹතැන්න සිට පූජාපිටිය දෙසට |
| * අඹතැන්න වෙළඳ සංකීර්ණය අසල | ව.අඩි. 250 | අඹතැන්න වෙළඳ සංකීර්ණය ඉදිරිපිට මාර්ගය කොටස කඩ කාමර අංක 01 සිට කාමර අංක 05 දක්වා කොටස |

*මාරතුගොඩ කොට්ඨාසය*

| | | |
|---|---|---|
| * බොක්කාවල නගරය | ව.අඩි. 900 | මොරන්කන්ද පාර වම වන්නි ස්ටෝර්ස් වෙළඳසැල අසල සිට මහජන බැංකුව දක්වා |
| * බොක්කාවල රෝහල හන්දිය | ව.අඩි. 300 | අරඹේකඩේ පාර දකුණ ලී මෝලට හැරෙන අතුරු මාර්ගය අසල |
| * මොලගොඩ හන්දිය | ව.අඩි. 350 | අරඹේකඩේ පාරේ උඩහේන හන්දියේ සිට උඩහේන පාර දකුණ වර්ග අඩි 350 ක ප්‍රමාණය |
| * හරංකහව පිරිවෙන හන්දිය | ව.අඩි. 350 | අරඹේකඩේ පාර දකුණ හරංකහව පිරිවෙන පාර ඉදිරිපිට පෙදෙස |
| * හරංකහව පතිරාද හන්දිය (මැටිබොක්ක හන්දිය) | ව.අඩි. 300 | අරඹේකඩේ බොක්කාවල මාර්ගයේ පතිරාද පාර දකුණ ආරම්භක ස්ථානයේ |
| * වැවල රුප්පවත්ත හන්දිය | ව.අඩි. 300 | පූජාපිටිය පාර බොක්කාවල පාර රුප්පවත්ත හන්දියේ සිට බොක්කාවල දෙසට |
| * නාවින්නාපිටිය හන්දිය | ව.අඩි. 350 | පූජාපිටියේ සිට බොක්කාවල පාර දකුණ නාවින්නාපිටිය පාර හංදියේ සිට බොක්කාවල දෙසට |
| * මාරතුගොඩ පිරිවෙන හංදිය | ව.අඩි. 400 | පූජාපිටිය බොක්කාවල පාර මාරතුගොඩ හංදිය පිරිවෙන හංදිය |
| * මාරතුගොඩ පාසල් හංදිය | ව.අඩි. 400 | පූජාපිටිය බොක්කාවල පාර වම මාරතුගොඩ ජාතික පාසලට හැරෙන හංදිය සිට බොක්කාවල දෙසට |
| * රඹුකේවල කඩමණ්ඩිය | ව.අඩි. 400 | රඹුකේවල කඩ මණ්ඩිය ඉදිරිපිට |
| * දොලපිහිල්ල අම්බලම අසල හන්දිය | ව.අඩි. 350 | පූජාපිටිය අංකුඹුර මාර්ගයේ දකුණ දොළපිහිල්ල අම්බලම ඉදිරිපිට |
| * කබල්ගස්තැන්න බුදු පිළිමය අසල | ව.අඩි. 300 | පූජාපිටිය සිට අංකුඹුර මාර්ගයේ කබල්ගස්තැන්න බුදු පිළිමය ඉදිරිපිට |

*අංකුඹුර කොට්ඨාසය*

| | | |
|---|---|---|
| * අංකුඹුර නගරය බෝධිය අසල | ව.අඩි. 900 | අංකුඹුර අලවතුගොඩ පාරේ විජේසිරි හෝටලය අසල සිට වම්පස තිස්ස හෝටලය දක්වා |
| * අංකුඹුර නගරය උඩහ හන්දිය අසල | ව.අඩි. 600 | අංකුඹුර පූජාපිටිය පාරේ දකුණුපස සමගි ටේලර්ස් සාප්පුව ළග සිට සෝමානන්ද මාවතේ ආරම්භය දක්වා |
| * කරගහපිටිය හන්දිය අසල | ව.අඩි. 150 | කරගහපිටිය හන්දිය දකුණුපස |
| * රාමාකොටුව කඩමණ්ඩිය අසල | ව.අඩි. 150 | අංකුඹුර පූජාපිටිය පාරේ රාමකොටුව කඩමණ්ඩිය දකුණුපස සමූපකාරය අසල සිට බස් නැවතුම්පල අසල දක්වා |
| * බැබිලගොල්ල කඩමණ්ඩිය අසල | ව.අඩි. 90 | ගල්හින්න පල්ලිය පාරේ පල්ලිය කොටුව කඩ මණ්ඩිය දකුණුපස කාල්ඩීන් මහතාගේ කඩ පෙල ඉදිරිපිට |
| * ගල්හින්න හන්දිය අසල | ව.අඩි. 300 | සිංහපාල මහතාගේ තේ කඩය ළග ගල්හින්න හන්දියේ වම්පස සිට හෝටලය දක්වා |

| | | |
|---|---|---|
| * පල්ලිය කොටුව කඩමණ්ඩිය අසල | ව.අඩි. 90 | ගල්හින්න පල්ලිය පාරේ පල්ලිය කොටුව කඩ මණ්ඩියේ දකුණු පස කාල්ඩීන් මහතාගේ කඩපෙල ඉදිරි පස |
| * බීරිහෙල හන්දිය අසල | ව.අඩි. 90 | බීරිහෙල බස් හරවන හන්දියේ අසල දකුණු පස පාරේ අයින |
| * කට්ටප්පුව හන්දිය අසල | ව.අඩි. 90 | අංකුඹුර පූජාපිටිය පාරේ කට්ටප්පුව කඩය අසල දකුණු පස |
| * අක්කරතුන හන්දිය අසල | ව.අඩි. 90 | බටගොල්ලාදෙණිය පාරේ වම් පස හුසේන් මහතාගේ කඩපෙළ ඉදිරි පස |

*උපලේඛන 02*

කුළී රථ වාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු :

| | | |
|---|---|---|
| (*01*) | ලොරියක් සඳහා | - රු. 100 මසකට |
| (*02*) | වෑන් රථයක් සඳහා | - රු. 100 මසකට |
| (*03*) | ට්‍රේලරය සහිත ට්‍රැක්ටරයක් සඳහා | - රු. 100 මසකට |
| (*04*) | ත්‍රීරෝද රථයක් සඳහා | - රු. 50 මසකට |
| (*05*) | මෝටර් රථයක් සඳහා | - රු. 75 මසකට |
| (*06*) | අත් ට්‍රැක්ටරයක් සඳහා | - රු. 50 මසකට |

*උපලේඛන 03*

*පූජාපිටිය ප්‍රාදේශීය සභාව*

***වාහන ලියාපදිංචිය සඳහා හා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

1. වාහනයේ අංකය සහ වර්ගය : ..........................................................
2. අයිතිකරුගේ නම : ..........................................................
3. හැඳුනුම්පත් අංකය : ..........................................................
4. අයිතිකරුගේ ලිපිනය : ..........................................................
5. රියදුරුගේ නම : ..........................................................
6. රියදුරුගේ හැඳුනුම්පත් අංකය : ..........................................................
7. රියදුරු බලපත්‍ර අංකය : ..........................................................
8. රියදුරුගේ ලිපිනය : ..........................................................
9. වාහනය නවතා තැබීමට ඉල්ලන ස්ථානය : ..........................................................
10. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාර්යක් සඳහා ද? : ..........................................................
11. එහි ධාරිතාව - ප්‍රමාණය : ..........................................................

ඉහත තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

..........................................................,
දිනය : .........................................................., අයදුම්කරුගේ / රියදුරුගේ අත්සන.

සභාපතිගේ නිර්දේශය

..........................................................,
දිනය : .......................................................... සභාපති.

06-225/2

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

තුම්පනේ ප්‍රාදේශීය සභාව

**අතුරු ව්‍යවස්ථා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උප වගන්තියේ 'ඌ' ජේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2011 අප්‍රේල් මස 26 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

***කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා***

01. මෙම අතුරු ව්‍යවස්ථා තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර සභාපතිවරයා විසින් නිවේදනය කරනු ලබන මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ස්ථානවල හැර වෙනත් කිසිදු පොදු ස්ථානයක මෝටර් රථයක් කුලියට ධාවනයේ යෙදවීමේ අරමුණ ඇතිව නවතා තැබීම නොකළ යුතු ය. සභාවේ යෝජනා සම්මුතියක් මගින් එම ස්ථාන සංශෝධනය කිරීම සහ නව ස්ථාන නම් කිරීම කරනු ලැබිය හැකි ය.

03. තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 02 වැනි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව පළමු උපලේඛනයේ සඳහන් ස්ථානවල දෙවැනි උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් සහ ඊට අදාළ රජයේ ගාස්තුත්, සභාවට මාසිකව ගෙවීමෙන් එකී ස්ථානවල කුලී රථවාහන නවතා තැබීම කළයුතු අතර, එම කුලී රථවාහන සභාවේ ලියාපදිංචි කළ යුතු ය. එම ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු වලංගු වන්නේ ය.

04. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකුගෙන් ලබාගත් බලපත්‍රය යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන රථවාහන නැවතුම්පලවල මෝටර් රථ වාහන නවතා තැබීම නොකළ යුතු අතර මෙය පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

05. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් හෝ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබූයේ එක් ලිත් මාසයක් වෙනුවෙන් ද ඒ මාසයේ අවසන් දිනයෙන් එහි වලංගු කාලය අවසන් වේ.

06. බලපත්‍රය ලබාගැනීම සඳහා තුන්වන උපලේඛනයේ ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන අයදුම්පතක් මගින් සභාපතිවරයා වෙත අයිතිකරු හෝ රියදුරු විසින් අයදුම් කළ යුතු ය.

07. රථවාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ වාහනයක් අයිතිකරු හෝ රියදුරු වෙත එම වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ බල පත්‍රය ඉදිරිපත් කරන ලෙස රථවාහන පාලකවරයෙකු හෝ එම කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලබන කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

08. සෑම මසක ම පළමුවැනි දිනට පෙර අදාළ මාසය සඳහා රථ වාහන නවතා තැබීමේ බලපත්‍රය ලබාගෙන තිබිය යුතු ය.

09. තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිදු මෝටර් රථයක් කුලී රථ වාහන නවතා තැබීමේ නැවතුම් පොලකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

10. ස්ථිර වශයෙන් හෝ දින 14 කට නොඅඩු කාලයක් අඛණ්ඩව කුලී රථ වාහන නැවතුම්පලකින් වාහනයක් ඉවත්කර ගන්නේ නම් ඉවත් කරගත් වහාම ඒ බව සභා කාර්යාලයට දැන්විය යුතුය. එසේ දැන්වීමක් නොකළහොත් අදාළ මාසික ගාස්තුව ගෙවිය යුතු ය.

11. කුලීරථ වාහන, නැවතුම්පල තුළ දී කිසියම් වාහනයක් අළුත්වැඩියා කිරීම හෝ සේදීම හෝ වෙනත් අයකු ලවා සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. යම් තැනැත්තෙකු කුලීරථ වාහන නවතා තැබීමේ ස්ථානයක හෝ වාහනයක් ඇතුළත හෝ බීමත්ව හෝ අනිසි ලෙස හෝ අශෝභන ලෙස හෝ හැසිරීම හෝ හිරිහැරයක් වන සේ හැසිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මඟින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝණය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

14. නිසි බලය ඇති අධිකරණයක් විසින් නියම කරනු ලැබූ වෙනත් යම් දඬුවමකට සහ / හෝ දඩයකට අමතරව මෙම අතුරු ව්‍යවස්ථාව කඩකිරීම සම්බන්ධයෙන් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ අයෙකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම නීත්‍යානුකූල වන අතර එසේ අවලංගු කිරීම වෙනුවෙන් කිසිදු වන්දියක් ලැබීමට ඔහුට හිමිකමක් නොමැත්තේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,

"රථ වාහන පාලක" යන්නෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් රථවාහන පාලනය කිරීම සඳහා පත්කර සිටින නිලධාරියෙකුද අදහස් වේ.

"මෝටර් රථය හෝ කුලී රථය" යන්නෙන් ත්‍රීරෝද රථයක්, ලොරියක්, වෑන්රථයක්, ට්‍රැක්ටරයක්, ට්‍රක් රථයක්, කාර් රථයක්, අත් ට්‍රැක්ටරයක් යනුවෙන් අදහස් කරේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*පළමු උපලේඛනය 1*

සලකුණු කර ඇති ස්ථාන :

1. නුවර සිට හතරලියද්ද පාරේ ගලගෙදර බස්නැවතුම වම්පස මීටර් 50
2. නුවර කුරුණෑගල පාරේ ගලගෙදර හන්දිය දකුණු පස අඩි 100
3. ගලගෙදර රඹුක්කන පාරේ මඩිගේ වෙළෙඳ සංකීර්ණය දකුණුපස අඩි 100
4. පෙතිගෙවල හන්දිය දෙපස මීටර් 100
5. අරඹේකඩේ හන්දිය නුවර කුරුණෑගල පාරේ වම්පස
6. අරඹේකඩේ සිට බොක්කාවල දක්වා පාරේ වලතැන්න හන්දිය දකුණු පස අඩි 100
7. අළුදෙනිය යටල හන්දිය හතරලියද්දේ සිට 9 කණුවට යන මාර්ගයේ වම්පස අඩි 50
8. නුවර කුරුණෑගල මාර්ගයේ කොටිකාම්බේ හන්දියේ වම්පස අඩි 100
9. නුවර රඹුක්කන මාර්ගයේ රංගමුව හන්දියේ වම්පස අඩි 50
10. ගලගෙදර රඹුක්කන පාරේ දේදුනුපිටිය ඉහළගම දකුණු පස මීටර් 50
11. නුවර රඹුක්කන මාර්ගයේ ගෙඩතලේ හන්දියේ දකුණු පස

12. අරඹේකඩේ සිට බොක්කාවල මාර්ගයේ ගිරිහාගම හන්දියේ වම්පස අඩි 50
13. හතරලියද්ද සිට නුවර පාරේ සංඝරාජපුර හන්දියේ දකුණුපස
14. හතරලියද්ද නුවර පාරේ දම්පාගොඩ හන්දියේ දකුණුපස අඩි 100
15. හතරලියද්ද මුරුද්දෙනිය පාරේ මුරුද්දෙනිය හන්දියේ දකුණුපස මීටර් 50
16. හතරලියද්ද සිට වැලිවිට සිහිවටනය පාරේ වැලිවිට හන්දියේ වම්පස
17. හතරලියද්ද බෝගස්හින්න පාරේ බෝගස්හින්න හන්දිය වම්පස අඩි 100
18. බෝගස්හින්න පාරේ මිණිගමුව හන්දිය දකුණු පස
19. හතරලියද්ද සිට නුවර පාරේ මීගස්තැන්න හන්දිය දකුණු පස මීටර් 50
20. හතරලියද්ද නුවර පාරේ ආරම්භ වන ස්ථානයේ වම්පස අඩි 100
21. අලගල්ල පාරේ වම්පස මීටර් 50
22. හතරලියද්ද නගරයේ සිට පල්ලේපොල මාර්ගයේ වැලිගොඩපොල හන්දියේ වම්පස
23. හතරලියද්ද පොල්වත්ත පාරේ දුංකුඹුර හන්දියේ සිට වම්පස
24. හතරලියද්දේ සිට උඩුව මාර්ගයේ උඩුව හන්දියේ වම්පස
25. නාරංවල හන්දියේ දෙකේ කණුව අසල මාර්ගයේ වම්පස මීටර් 50
26. ඕපල්ල හන්දිය නුවර සිට මාවතගම පාරේ ඕපල්ල හන්දිය දකුණු පස අඩි 100
27. ඕපල්ල සිට මාවතගම මාර්ගයේ කවුඩැල්ල හන්දියේ වම්පස අඩි 50
28. ගලගෙදර මහනුවර මාර්ගයේ කෝපිවත්ත 10 කණුව හන්දියේ වම්පස අඩි 100
29. හතරලියද්ද සිට එරමුදුලියද්ද පාරේ එරමුදුලියද්ද හන්දියේ දකුණු පස අඩි 50

*දෙවන උපලේඛන*

කුලී රථ වාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු

| | | | |
|---|---|---|---|
| (අ) | ලොරියක් සඳහා මසකට | - | රු. 500 |
| (ආ) | වෑන් රථයක් සඳහා මසකට | - | රු. 500 |
| (ඇ) | ට්‍රේලරය සහිත ට්‍රැක්ටරයක් සඳහා මසකට | - | රු. 250 |
| (ඈ) | ත්‍රීරෝද රථයක් සඳහා මසකට | - | රු. 250 |
| (ඉ) | කාර් එකක් සඳහා මසකට | - | රු. 500 |
| (ඊ) | අත් ට්‍රැක්ටරයක් සඳහා මසකට | - | රු. 250 |

*තුන්වන උපලේඛන*

**තුම්පනේ ප්‍රාදේශීය සභාව**

***වාහන ලියාපදිංචිය සඳහා හා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

1. වාහනයේ අංකය සහ වර්ගය : .........................................................
2. අයිතිකරුගේ නම : .........................................................
3. හැඳුනුම්පත් අංකය : .........................................................
4. අයිතිකරුගේ ලිපිනය : .........................................................
5. රියදුරුගේ නම : .........................................................
6. රියදුරුගේ හැඳුනුම්පත් අංකය : .........................................................
7. රියදුරුගේ බලපත්‍ර අංකය : .........................................................
8. රියදුරුගේ ලිපිනය : .........................................................
9. වාහනය නවතා තැබීමට ඉල්ලා සිටින ස්ථානය : .........................................................
10. වාහනය පාවිච්චි කළ හැක්කේ කුමන කාරනයක් සඳහා ද? : .........................................................
11. එහි ධාරිතාව - ප්‍රමාණය : .........................................................

ඉහත තොරතුරු නිවැරදි සහ සත්‍ය බවට සහතික කරමි.

.........................................................
අයදුම්කරුගේ / රියදුරුගේ අත්සන.

දිනය : .........................................................

*සභාපතිගේ නිර්දේශය -*

.........................................................
සභාපති.

දිනය : .........................................................

06-225/3

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (X) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2011 අප්‍රේල් මස 26 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*සංචාරක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

01. මෙම අතුරු ව්‍යවස්ථා හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම, විධිමත් කිරීම අධීක්ෂණය කිරීම පාලනය කිරීම සහ ගාස්තු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. කිසිම තැනැත්තෙකු විසින් හඟුරන්කෙත ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ පිහිටි යම් වීථියක, පොදු උද්‍යානයක, පොදු පිට්ටනියක හෝ විවෘත භූමියක මෝටර් රථ වාහන නැවැත්වීම සඳහා වෙන්කර ඇති ස්ථානයක හෝ වෙනයම් විවෘත භූමියක කිනම් හෝ භාණ්ඩයක් සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් නොමැතිව විකිණීම හෝ විකිණීම සඳහා තැනින් තැන ගෙනයාම නොකළ යුතු ය.

03. මෙම අතුරු ව්‍යවස්ථාව අනුව බලපත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන අයෙකු ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබාගන්නා ලද 1 වැනි උපලේඛනයේ ආකෘති පත්‍රය මගින් අයදුම්කළ යුතු ය. එම අයදුම්පත්‍රය සමග සෙ.මී. 2 x සෙ.මී. 2.5 ප්‍රමාණයෙන් වූ අයදුම්කරුගේ උඩුකය දැක්වෙන වර්ණ ඡායාරූප 02ක් සහ බලපත්‍රය අයදුම්කරන දිනයට පෙරාතුව ම වූ දින 30 තුළ දී පිළිගත් වෛද්‍යවරයෙකු විසින් නිකුත් කළ ස්පර්ශක හෝ බෝවන රෝග නොමැති බවට වෛද්‍ය සහතිකයක් සමග ඉදිරිපත් කළ යුතු ය.

04. 02 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම අටවන අතුරු ව්‍යවස්ථාව අනුව අවලංගු නොකළහොත් ඒ බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් ලිත් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට බලාත්මකභාවය අවසන් වේ.

05. බලපත්‍රලාභියා විසින් 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා දෙවැනි උපලේඛනයෙහි සඳහන් ගාස්තුවක් සභාවට ගෙවිය යුතු අතර එම බලපත්‍ර ගාස්තු ද සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු වලංගු වන්නේ ය.

06. සභාව විසින් වරින් වර සංචාරක වෙළඳාම සම්බන්ධයෙන් පනවනු ලබන කොන්දේසිවලට අනුකූලව බලපත්‍රධාරියා ක්‍රියා කළ යුතු ය.

07. ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි යම් ප්‍රදේශයක සභා සම්මුතියක් මගින් සංචාරක වෙළඳාම තහනම් කර ඇති අවස්ථාවක එම ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

08. හයවැනි හා හත්වැනි අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කරමින් යම් පුද්ගලයෙකු කටයුතු කරන්නේ නම් ඔහුට නිකුත් කර ඇති බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කරනු ලැබිය හැක. එවන් අවස්ථාවක දී බලපත්‍රධාරියාට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් කිසිම වන්දියක් ලබාගැනීමේ අයිතියක් නොතිබිය යුතු ය.

09. ආහාර විකිණීමෙහි නිරත වී සිටින සෑම සංචාරක වෙළෙන්දෙකු ම පහත සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය :—

(i) විකිණීම සඳහා එහා මෙහා ගෙන යනු ලබන ආහාර ද්‍රව්‍ය බහාලන පෙට්ටි හෝ බඳුන් සෞඛ්‍යාරක්ෂිත පරිදි තබාගත යුතු අතර මැස්සන් හා වෙනත් කෘමි සතුන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂා වන පරිදි යෝග්‍ය වැස්මකින් ආවරණය කර තබාගත යුතු අතර එම ආහාර පුද්ගලයන්ට ස්පර්ශ කිරීමටද ඉඩ නොදිය යුතු ය.

(ii) ආහාර තබාගන්නා වාහනය, පාපැදිය, කරත්ත, භාජන හා තැටි ආදිය සහ ආහාර සමග ස්පර්ශ වන සියලු උපකරණ හා ආවරණ නිතිපතා පිරිසිදුව තබාගත යුතු ය.

(iii) ආහාර එතීම සඳහා පාවිච්චි කරනු ලබන කඩදාසි හෝ ද්‍රව්‍ය පිරිසිදු හා ඒ සඳහා සුදුසු තත්වයක පැවතිය යුතු ය.

(iv) ආහාර ස්පර්ශ කිරීම සඳහා පිරිසිදු උපකරණ හා මෙවලම් පාවිච්චි කළ යුතු ය.

(v) කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින්ට අන්තරාදායක හෝ පීඩාවක් වනසේ ගින්දර පාවිච්චි නොකළ යුතු ය.

(vi) සංචාරක වෙළඳුන් විසින් පරිසර දූෂණයට තුඩුදෙන අයුරින් කිසිම අපද්‍රව්‍යයක් යම් වීදියක, ප්‍රසිද්ධ ස්ථානයක, මහා මාර්ගයක හෝ ජලාශයකට බැහැර නොකළ යුතුය.

(vii) සියලුම සංචාරක වෙළඳුන් වෙළඳාම් කරන කාලය තුළදී සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත පාරිභෝගිකයන්ට පෙනෙන ආකාරයෙන් පැළඳ සිටිය යුතු ය.

10. ගෝඝාතක ආඥාපනතේ සහ වනජීවී පනතේ සඳහන් කර ඇති සතෙකු හෝ සතුන්ගේ මස් සංචාරක වෙළෙන්දෙකු විසින් නොවිකිණිය යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් බලපත්‍රධාරියෙකු විසින් පිසූ හෝ සකස් කළ ආහාර විකිණීමේ දී ආහාර පනතේ විධිවිධානවලට යටත්විය යුතු ය.

12. යම් ආසාදන ස්පර්ශක රෝගයකින් බලපත්‍රධාරියා පෙළෙන්නේ නම් හෝ තම නිවසෙහි එවැනි රෝගියෙකු නේවාසිකව සිටී නම් හෝ එවැනි රෝගියෙකුට බලපත්‍රධාරියා සාත්තු කරන්නේ නම් බලපත්‍රධාරියා වහාම සංචාරක වෙළඳාම නැවැත්විය යුතු අතර එම රෝගයේ බෝවන කාල පරිච්ඡේදය ඉක්මවීමෙන් පසු බලපත්‍රධාරියාට නැවත වෙළඳාම ආරම්භ කළ හැකිය.

13. බලපත්‍රධාරියා විසින් වීථියක, පදික වේදිකාවක හෝ විවෘත ස්ථානයක ගමන් කරන කිසිම පුද්ගලයෙකුට අවහිර වන අන්දමින් තම වෙළඳාම නොකළ යුතු ය.

14. බලපත්‍රධාරියා විසින් කවර හෝ දිනයක පෙරවරු 6.00ත් පස්වරු 9.00ත් අතර කාලය තුළ හැර කිසිම භාණ්ඩයක් විකිණීම, වෙළඳාම් කිරීම සඳහා එහා මෙහා ගෙනයාම නොකළ යුතු ය.

15. 13 වැනි අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කරන කවරෙකුගේ හෝ වුවද වෙළඳ භාණ්ඩ අත්අඩංගුවට ගැනීමටත් එසේ අත්අඩංගුවට ගත් භාණ්ඩ සම්බන්ධව සභාපතිවරයා තීරණය කරන අන්දමට ක්‍රියා කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය.

16. ජාතික ආගමික හෝ වෙනත් යම් උත්සව අවස්ථාවක දී පමණක් පැමිණෙන සංචාරක වෙළඳුන් ප්‍රාදේශීය සභාව විසින් නිශ්චය කරනු ලබන ගාස්තු ප්‍රමාණයක් ගෙවා තාවකාලික බලපත්‍රයක් ලබාගත යුතු ය.

17. බලපත්‍රධාරියා විසින් තමා වෙත නිකුත් කර ඇති බලපත්‍රය අන්සතු නොකළ යුතු අතර එසේ අන්සතු කරන ලද බව අනාවරණය වූ ඕනෑම අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමේ බලය සභාපතිවරයා සතුවේ.

18. සභාපතිවරයාට හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුට ඕනෑම සංචාරක වෙළෙන්දෙකු විසින් වෙළඳාම් කරනු ලබන වෙළඳ භාණ්ඩ හා බලපත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටින විටදී ඉදිරිපත් කළ යුතු ය.

19. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝණය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝණය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝණය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

20. අර්ථ නිරූපනය :

"සභාව" යන්නෙන් හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ සභාපති අදහස් වේ,

"සංචාරක වෙළඳාම" යන්නෙන් නිශ්චිත ස්ථානයක් නොමැතිව තැනින් තැනට වෙළඳ ද්‍රව්‍ය ඔසවාගෙන යාමෙන් හෝ යතුරු පැදියක, පාපැදියක, ත්‍රීවිල් රථයක, වෑන් රථයක හෝ සංචාරක වෙළඳාම අරමුණු කරගෙන සකස් කර ගන්නා ලද යන්ත්‍රාණුසාරයෙන් හෝ අතින් ක්‍රියාත්මක කරනු ලබන වාහනයක් මගින් ගෙනයාමෙන් කරනු ලබන වෙළඳාම අදහස් වේ,

"බලය පැවරූ නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පැවරූ කිසියම් නිලධාරියෙකු අදහස් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත් වේ.

*උපලේඛන අංක 01*

*ආදර්ශ අයදුම් පත්‍රය*

සංචාරක වෙළඳාම සඳහා බලපත්‍ර ලබාගැනීමේ අයදුම්පත්‍රය

ලියාපදිංචි අංකය :

වර්ෂය :

1. සම්පූර්ණ නම : ..........................................................
2. පුද්ගලික ලිපිනය : ..........................................................
3. හැඳුනුම්පත් අංකය : ..........................................................
4. දුරකථන අංකය : ..........................................................
5. ව්‍යාපාර ස්වභාවය : ..........................................................
6. ව්‍යාපාරය සිදු කරන ආකාරය : ..........................................................
   (භාණ්ඩ තැනින් තැනට ගෙන යන්නේ කුමන අයුරින්දැයි විස්තර කරන්න)
7. ප්‍රථමවරට ව්‍යාපාරය ආරම්භ කළ දිනය : ..........................................................
8. පසුගිය වර්ෂයේ ගෙවීම් විස්තර :

| ව්‍යාපාර ස්වභාවය | ගාස්තුව | ලදුපත් අංකය | බලපත්‍ර අංකය |
|---|---|---|---|
| ............................... | .................. | ........................................... | ............................................... |
| ............................... | .................. | ........................................... | ............................................... |
| ............................... | .................. | ........................................... | ............................................... |

ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ................................. වර්ෂයට මා වෙත බලපත්‍රයක් නිකුත් කරන මෙන් ඉල්ලමි.

.......................................................... ..........................................................

දිනය. අත්සන.

*උපලේඛන අංක 02*

*සංචාරක වෙළඳාම සඳහා අයකරන වාර්ෂික බලපත්‍ර ගාස්තු*

| *අනු. අංකය* | *ව්‍යාපාර ස්වභාවය* | *ගාස්තුව* <br> *රු. ශ.* |
|---|---|---|
| 01 | අළුත් මාළු විකිණීම | 1,000.00 |
| 02 | වඩේ හෝ කෙටි කෑම වර්ග විකිණීම | 750.00 |
| 03 | කඩල මුරුක්කු හෝ බයිට් වර්ග විකිණීම | 750.00 |
| 04 | එළවළු විකිණීම | 1,000.00 |
| 05 | පළතුරු විකිණීම | 1,000.00 |
| 06 | මල්පැල, විසිතුරු පැල වර්ග විකිණීම | 750.00 |
| 07 | නිමි ඇඳුම් හෝ රෙදිවර්ග විකිණීම | 750.00 |
| 08 | පාවහන් වර්ග විකිණීම | 750.00 |
| 09 | ප්ලාස්ටික් බඩු හෝ මුළුතැන්ගෙයි උපකරණ වැනි දෑ විකිණීම | 750.00 |
| 10 | සුවඳ විලවුන් වර්ග හා ආලේපන වර්ග විකිණීම | 750.00 |
| 11 | කුඩා ළමයින්ගේ සෙල්ලම් බඩු ක්‍රීඩා උපකරණ විකිණීම | 750.00 |
| 12 | අයිස්ක්‍රීම් / අයිස් පලම් විකිණීම | 750.00 |
| 13 | අරුමෝසම් බඩු විකිණීම | 750.00 |
| 14 | රසකැවිලි වර්ග විකිණීම | 750.00 |
| 15 | ඉහත උපලේඛනයේ විස්තර නොකළ වෙනත් භාණ්ඩ වර්ග විකිණීම | 1,000.00 |

06-225/4

**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (XIV) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍ය.

2011 අප්‍රේල් මස 26 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ආදාහනාගාර කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. මෙම අතුරු ව්‍යවස්ථා "පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර කටයුතු පාලනය හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" යනුවෙන් හැඳින්වේ.

2. පූජාපිටිය ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාර භාවිතා කිරීම, පාලනය කිරීම හා එකී ආදාහනාගාරය භාවිතා කිරීම සඳහා වන ගාස්තු නියම කිරීම හා අයකිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් හෝ මෘත ශරීරයක කොටසක් හෝ මිනිස් කළලයක් ආදාහනය නොකළ යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාවල තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන මෙහි මින්මතු ඉල්ලුම්කරු යයි සඳහන් කරනු ලබන තැනැත්තෙකු විසින් "2" උපලේඛනයට අනුකූලව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා වෙත හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය :–

(i) මිය ගිය අය හා අයදුම්කරු අතර ඥාතීත්වය තහවුරු කළහැකි ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය ; (මේ සඳහා මිය ගිය අය පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් හෝ සභාවේ ගරු සභිකයෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ අයදුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ විවාහ සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක් ප්‍රමාණවත් වේ.)

(ii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක පිටපතක් හෝ අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් ලියවිල්ලක් ;

(iii) 1975 අංක 41 දරන විවාහ උප්පැන්න හා මරණ (සංශෝධිත) පනතේ සංශෝධිත උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 110 වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තියේ විධිවිධාන යටතේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නිකුත් කරනු ලැබූ මරණ ලියාපදිංචි කිරීමේ සහතිකයේ පූජාපිටිය ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ආදාහනය කරන බවට සඳහන් වී තිබිය යුතු ය.

(iv) මිය ගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් උපත් හා මරණ ලියාපදිංචි

කිරීමේ පනතේ 41 (ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය ;

(v) අජීවී උපතකින් බිහි කරන ලද මෘත ශරීරයක් නම් උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 41(1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය, සභාපති හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකු වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණ අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වන්නේ ය. ඒ අනුපිළිවෙළ මත ආදාහන වේලාවල් නියමකර අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ආදාහනාගාර ගාස්තු ලෙස මෙහි පළමු උපලේඛනයේ දැක්වෙන ගාස්තුවක් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු ය. මෙම ගාස්තු ප්‍රාදේශීය සභාවේ සභා සම්මුතියක් මගින් වරින්වර සංශෝධනය කළ හැකි ය. එකී ගාස්තු ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කළ යුතු ය. එම ගාස්තු සභා කාර්යාලයේ සහ ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුට අයදුම්පත ලද වහාම දැන්විය යුතු ය.

8. සෑම දිනක ම පෙරවරු 06.00ත් පස්වරු 06.00 ත් අතර කාලය තුළ පමණක් ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරදිය යුතු ය. පස්වරු 06.00 ට පෙරාතුව වූ වේලාවක ආදාහනය සඳහා භාරගත් මෘත ශරීරයක් පස්වරු 06.00 පසු වූව ද ආදාහනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

9. ඉල්ලුම්කරු විසින් අවසර පත්‍රයේ සඳහන්කර ඇති වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම හේතුවෙන් ඇතිවන අපහසුකම් හෝ අලාභ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වග කියනු නොලැබේ.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය මියගිය අයගේ නම හා ඔහු මියයාමට ප්‍රථම පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාවය, ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ඇතුළත් ලේඛනයක් ආදාහනාගාරය භාරකරු විසින් පවත්වාගෙන යා යුතු ය.

11. ආදාහනාගාරයේ දේහය ආදාහනය කරන අවස්ථාවේ යාන්ත්‍රික දෝෂයක් මත ආදාහනය කිරීමට නොහැකි වුවහොත් සභාපතිවරයාගේ උපදෙස් මත එකී දේහය පිළිබඳව වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට ඉල්ලුම්කරු විසින් එකඟ විය යුතු ය.

12. මෘත ශරීරය ආදාහනයකර පැය 72 ක් ගත වීමට ප්‍රථම ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා භෂ්මාවශේෂ භාරගත යුතුවේ. නියමිත කාලය ඇතුළත භාරගනු නොලබන භෂ්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

13. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැති ව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වූවද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍ර ලාභියකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබේ.

14. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළවලට අලාභ හානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින් ගේ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ නොකළ යුතු ය. ඉදින් එවැනි අලාභයක් හෝ හානියක් හෝ සිදුවුවහොත් එකී ආදාහනයට අදාළ වූ අවසරපත්‍රධාරියා වගකිව යුතු වේ. එවැනි අලාභයක් තක්සේරු කිරීමෙන් අනතුරු ව එම අලාභය බලපත්‍රධාරියා වෙත දැන්වීමෙන් පසුව ඔහු විසින් එම වටිනාකම ගෙවිය යුතු ය. එම ගෙවීම පැහැර හරින්නේ නම් නිසි බලයලත් අධිකරණයක් හමුවට පමුණුවා එකී මුදල දඩයක් පරිදි අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

15. ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිලි කිරීම ප්‍රාදේශීය සභාවේ ලිඛිත අනුමැතියකින් තොරව සිදු නොකළ යුතු ය.

16. ආදාහනාගාරයක නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක්වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවේ -

"සභාව" යන්නෙන් පූජාපිටිය ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් තත්කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල පූජාපිටිය ප්‍රාදේශීය සභාවට පත්කර ගන්නා ලද සභාපති වරයා ද,

"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයෙකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක් ද,

"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද අදහස් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

*උපලේඛනය 1*

| | | |
|---|---|---|
| 01. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා | - රු.6,000/- |
| 02. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොවන මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා | - රු.6,500/- |
| 03. | ආදාහනාගාරය ස්ථාපිත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා | - රු.5,000/- |

*උපලේඛනය 2*

***පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අයදුම් පත්‍රය***

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :———.
ලිපිනය :———.
ජාතික හැඳුනුම්පත් අංකය :———.
ග්‍රාම නිලධාරී වසම :———.

02. මියගිය අයගේ නම :———.
මියගිය අයගේ ලිපිනය :———.
ජාතික හැඳුනුම්පත් අංකය :———.
ග්‍රාම නිලධාරී වසම :———.
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :———.

03. අයදුම්කරු මියගිය අයට ඇති ඥාති සම්බන්ධය :———.

04. මරණ සහතිකයේ අංකය හා දිනය :———.

05. මරණ රෙජිස්ට්‍රාර්ගේ නම හා ලිපිනය :———.

06. මරණයට හේතුව :———.

07. මරණ පරීක්ෂණයක් තිබුණේ නම් එය පවත්වන ලද දිනය හා වේලාව :———.

08. මරණ පරීක්ෂකගේ නම හා තනතුර :———.

09. මරණ පරීක්ෂකගේ තීරණය :———.

10. මෘත ශරීරය ආදාහනය සඳහා අවසර ලැබුණේ ද/
නොලැබුණේ ද යන වග :——— .

11. ආදාහනය කිරීමට අදහස් කරන දිනය හා වේලාව :——— .

12. දුරකථන අංකය :——— .

ඉහත මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවරදි බව සහතික කරමි. අවශ්‍ය සියළු සහතික මේ සමග අමුණා ඇත.

දිනය :——— .

...............................................
අයදුම්කරුගේ අත්සන.

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :*

1. අවසර පත්‍රය නිකුත් කිරීම අනුමත කරමි/නොකරමි.

......................................................
ලේකම්,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

දිනය :——— .

.....................................................
සභාපති/බලය පැවරූ නිලධාරියා,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

දිනය :——— .

2. අංක ........................................ හා ...................................... දිනැති ලදුපතින් රු. .............................................. ක් අය කරන ලදී.

3. ඉල්ලීම ඉටු කිරීමට අවසර දීම නිර්දේශ කරමි/නොකරමි.

4. නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු ඃ

......................................................
විෂය ලිපිකරු.

දිනය :——— .

06-225/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.